| | |
|---|---|
| **නිකුත් කළේ** | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2023.02.02 |

## ශ්‍රී ලංකාවේ 75 වන නිදහස් සැමරුම නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කාසියක් නිකුත් කරයි.

2023.02.04 දිනට යෙදෙන 75 වන නිදහස් සැමරුම නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් 1000 ක වටිනාකමින් යුත් සංසරණය සඳහා නොයෙදූ සමරු කාසියක් නිකුත් කරන ලදී. මෙය මහ බැංකුව විසින් නිකුත් කරන ලද 71 වන සමරු කාසිය වේ. මෙම කාසිය පිළිබඳ විස්තර සහ පිරිවිතර පහත දැක්වේ.

| කාසියේ මුහුණත | කාසියේ පිටුපස |
|---|---|
|  |  |
| “75” අංකය විශාල ඉලක්කමින් සහ ශ්‍රී ලංකා ජාතික ධජය ඔසවාගෙන සිටින ආකාරය කාසිය මධ්‍යයේ දැක්වේ. කාසිය ඉහළ දාරයේ පරිධියේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් “නිදහස් සැමරුම” ලෙස දැක්වේ. “1948 - 2023” වර්ෂ කාසියේ පහළ දාරයේ පරිධියේ දැක්වේ. | මුහුණත වටිනාකම “1000” විශාල ඉලක්කමින් කාසියේ මධ්‍යයේ දැක්වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් “රුපියල්” යන වචන මුහුණත වටිනාකමට පහළින් දැක්වෙන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය මුහුණත අගයට ඉහළින් දැක්වේ. “2023” වර්ෂය කාසියේ පහළ දාරයේ දැක්වේ. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් “ශ්‍රී ලංකා” යන වචන කාසියේ ඉහළ දාරයේ පරිධියේ දැක්වේ. |

| කාසිය පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| **කාසියේ සඳහන් වර්ෂය** | 2023 | **ටංකනය කළ කාසි ගණන** | 2,500 |
| **ලෝහය** | තඹ - නිකල් | **හැඩය** | රවුම් |
| **කාසි වර්ගය** | සංසරණය සඳහා නොයෙදූ | **නිමාව** | හිමාකාර, වර්ණ සහිත |
| **විෂ්කම්භය** | මි.මී. 38.61 | **බර** | ග්‍රෑම් 28.28 |

මෙහි පළමු සමරු කාසිය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා විසින් ශ්‍රී ලංකා ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත අද දින මහනුවර ජනාධිපති මන්දිරයේ දී නිල වශයෙන් පිළිගන්වන ලදී.



මෙම සමරු කාසිය තථ්‍යතා සහතිකය සමඟ ආකර්ෂණීය බහාලුමක නිකුත් කරනු ලබයි. අලෙවිය සඳහා සීමිත කාසි ප්‍රමාණයක් පමණක් පවතින අතර කොළඹ 1, වැතැම් වීදිය, අංක 54, සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැඟිල්ල යන ස්ථානයේ පිහිටි ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සහ අනුරාධපුරය, මාතලේ, මාතර, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා නුවරඑළිය යන ස්ථාන වල පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හරහා 2023 මාර්තු මස සිට අලෙවි කිරීමට නියමිතය. කාසිය අලෙවි කිරීමට නියමිත මිල සහ දිනය ඉදිරියේ දී මහජනතාව වෙත දැනුම් දෙනු ඇත.

| වැඩි විස්තර සඳහා: | දුරකථන අංකය | ෆැක්ස් අංකය | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව | +94 11 247 7587 | +94 11 247 7726 | currency@cbsl.lk |
| විද්‍යුත් ලිපිනය | currency@cbsl.lk | | |
| ආර්ථික ඉතිහාස කෞතුකාගාරය | +94 11 438 7405<br>+94 11 244 4503 | - | - |
| ප්‍රාදේශීය කාර්යාල: | | | |
| අනුරාධපුරය | +94 25 222 2024 | +94 25 222 5689 | roapura@cbsl.lk |
| මාතලේ | +94 66 222 2167 | +94 66 222 2175 | romatale@cbsl.lk |
| මාතර | +94 41 222 2269 | +94 41 222 2719 | romatara@cbsl.lk |
| ත්‍රිකුණාමලය | +94 26 222 6965 | +94 26 222 6967 | po-ep@cbsl.lk |
| කිලිනොච්චිය | +94 21 228 5914 | +94 21 228 5911 | rokn@cbsl.lk |
| නුවරඑළිය | +94 52 223 5439 | +94 52 222 4294 | rone@cbsl.lk |

ව්‍යවහාර මුදල් අධිකාරී
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත,
කොළඹ 1